ෂය අංකය
ாட இலக்கம் **62**

විෂයය
பாடம் පුරවැසි අධ්‍යාපනය

## I පත්‍රය - පිළිතුරු
## I பத்திரம் - விடைகள்

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරෙහි අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 04 | 11. | 02 | 21. | 04 | 31. | 01 |
| 02. | 02 | 12. | 01 | 22. | 03 | 32. | 02 |
| 03. | 03 | 13. | 04 | 23. | 01 | 33. | 03 |
| 04. | 01 | 14. | 01 | 24. | 03 | 34. | 01 |
| 05. | 04 | 15. | 02 | 25. | 02 | 35. | 04 |
| 06. | 01 | 16. | 03 | 26. | 02 | 36. | 02 |
| 07. | 04 | 17. | 04 | 27. | 01 | 37. | 02 |
| 08. | 02 | 18. | 02 | 28. | 04 | 38. | 03 |
| 09. | 01 | 19. | 04 | 29. | 01 | 39. | 04 |
| 10. | 02 | 20. | 03 | 30. | 03 | 40. | 02 |

විශේෂ උපදෙස් / விசேடஅறிவுறுத்தல் } එක් පිළිතුරකට ලකුණු / ஒரு சரியான விடைக்கு **01** බැගින් / புள்ளி வீதம்

මුළු ලකුණු / மொத்தப் புள்ளிகள் **01 × 40 = 40**

---

හත නිදසුනෙහි දැක්වෙන පරිදි බහුවරණ උත්තරපත්‍රයේ අවසාන තීරුවේ ලකුණු ඇතුළත් කරන්න.
ழ் குறிப்பிடப்பட்டிருக்கும் உதாரணத்திற்கு அமைய பல்தேர்வு வினாக்களுக்குரிய புள்ளிகளை பல்தேர்வு னாப்பத்திரத்தின் இறுதியில் பதிக.

| | |
|---|---|
| වැරදි පිළිතුරු සංඛ්‍යාව / ரியான விடைகளின் தொகை | 25 / 40 |
| I පත්‍රයේ මුළු ලකුණු / பத்திரம் I இன் மொத்தப்புள்ளி | 25 / 40 |

Past Papers Wiki

# 62 - පුරවැසි අධ්‍යාපනය II

> ✻ **පළමුවන** ප්‍රශ්නය අනිවාර්ය වේ.
> ✻ **පළමුවන** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළුව, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

**1. වන ප්‍රශ්නයේ අපේක්ෂිත ඉගෙනුම් ඵල -**

- පරිසරයේ සිදුවන එදිනෙදා වෙනස්කම් පිළිබඳව තිබෙන දැනුවත්භාවය විස්තර කරයි.
- පුරවැසියෙකු විසින් සමාජයට ඉටු කළ යුතු සදාචාරාත්මක යුතුකම් විස්තර කරයි.
- ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන නීතිය ක්‍රියාත්මක වන ආකාරය අනුව ප්‍රභේද නම් කරයි.
- සෝල්බරි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ මගින් ඇති කරන ලද වෙනස්කම් පැහැදිලි කරයි.
- පුරවැසියන් ලෙසින් අපට හිමිවන විවිධ මානව අයිතිවාසිකම් විස්තර දක්වයි.
- රටක සංවර්ධනය මැනීම සඳහා නූතනයේ දී භාවිත කරනු ලබන මිනුම් දර්ශක විස්තර කරයි.
- රාජ්‍යයක දක්නට ලැබෙන බලයෙහි විවිධ ස්වරූප විමර්ශනය කරයි
- බහු සංස්කෘතික සමාජයක ජනතාව එක්සත්ව ක්‍රියා කිරීම නිසා ඇති වන වාසි විග්‍රහ කරයි.
- ආර්ථිකයක් තුළ නිෂ්පාදිත භාණ්ඩ පාරිභෝගිකයා දක්වා බෙදාහරින ආකාරයන් විශ්ලේෂණය කරයි.
- එක්සත් ජාතීන්ගේ සංවිධානයට අනුබද්ධ ආයතන පැහැදිලි කරයි.

**1.** (i) ශ්‍රී ලංකාවට 2025 නොවැම්බර් මාසයේ බලපෑ සුළි සුළං තත්ත්වය නිසා බරපතලම හානි සිදු වූ පළාත් **දෙක** මොනවා ද?

(ii) පුරවැසියකු විසින් සමාජයට ඉටු කළ යුතු සදාචාරාත්මක යුතුකම් **දෙකක්** සඳහන් කරන්න.

(iii) නීතිය ක්‍රියාත්මක වන ආකාරය අනුව බෙදිය හැකි කොටස් **දෙක** මොනවා ද?

(iv) සෝල්බරි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ මගින් ශ්‍රී ලංකාවට හඳුන්වා දුන් ප්‍රධාන ප්‍රතිසංස්කරණ **දෙකක්** සඳහන් කරන්න.

(v) මානව අයිතිවාසිකම් වර්ග කළ හැකි ආකාර **දෙකක්** සඳහන් කරන්න.

(vi) සංවර්ධනය මැනීම සඳහා භාවිත කරන නූතන මිනුම් දර්ශක **දෙකක්** දක්වන්න.

(vii) රාජ්‍යයකට ක්‍රියාත්මක කළ හැකි බලයෙහි විවිධ ස්වරූප **දෙකක්** සඳහන් කරන්න.

(viii) බහු සංස්කෘතික සමාජයක ජනතාව එක්සත්ව කටයුතු කිරීමෙන් ලැබිය හැකි වාසි **දෙකක්** සඳහන් කරන්න.

(ix) නිෂ්පාදිත භාණ්ඩ පාරිභෝගිකයා දක්වා බෙදාහැරීමේ දී අනුගමනය කරන ප්‍රධාන වෙළඳාම් ක්‍රම **දෙක** මොනවා ද?

(x) එක්සත් ජාතීන්ගේ සංවිධානයට අනුබද්ධ ආයතන **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 × 10 = 20 යි)

(i) ත්‍රිකුණාමල ගැන සැබි පැලන්ල්ලේ දකින ඇ.

- මධ්‍යම පළාත
- ඌව පළාත

**(ඉහත සඳහන් කර ඇති පළාත් දෙක ලියා ඇත්නම් ලකුණු දෙකක් දෙන්න.)**
**(ලකුණු 02)**

(ii)

- වැඩිහිටියන්ට ගරු කිරීම./සමාජ සිරිත් විරිත් පිළිපැදීම
- අන්‍ය ආගම්වලට ගරු කිරීම
- බහු සංස්කෘතීන්ට අගය කිරීම
- සම්ප්‍රදායන්ට අනුව කටයුතු කිරීම
- සදාචාරාත්මක හැසිරීම .

**මෙවැනි යුතුකම් අතුරින් දෙකක් (02) ලියා තිබීම අවශ්‍ය වේ. මීට සමාන අදහස දෙන වෙනත් පිළිතුරු සඳහා ද ලකුණු ලබා දෙන්න.**
**(ලකුණු 02)**

(iii)

- දේශීය නීතිය/ස්වදේශීය නීතිය
- අන්තර් ජාතික නීතිය / ජාත්‍යන්තර නීතිය

**මෙම පිළිතුරු දෙක ලියා තිබිය යුතුය. එක් පිළිතුරකට එක් ලකුණක් බැගින් ලබා දෙන්න.**
**(ලකුණු 02)**

(iv)

- බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයෙන් නිදහස ලැබීම
- කැබිනට් ආණ්ඩු ක්‍රමයක් හඳුන්වා දීම
- ද්වි මාණ්ඩලික පාර්ලිමේන්තුව හඳුන්වා දීම
- බ්‍රිතාන්‍ය කිරීටය වෙනුවට අග්‍රාණ්ඩුකාර ධුරයක් ඇති කිරීම
- අවසාන අභියාචනාධිකරණය ලෙස බ්‍රිතාන්‍ය ප්‍රිවි කවුන්සිලය පිළිගැනීම
- රාජ්‍යසේවා කොමිෂන් සභාව පිහිටුවීම
- අධිකරණ සේවා කොමිෂන් සභාව පිහිටුවීම
- සුළු ජාතික අයිතිවාසිකම් සම්බන්ධව විශේෂ අවධානයක් යොමු කිරීම

**ඉහත සඳහන් කරුණු අතරින් ඕනෑම දෙකක් (02) ලියා තිබීම අවශ්‍ය ය. එක් කරුණකට එක් ලකුණ බැගින් ලබා දෙන්න.**
**(ලකුණු 02)**

(v)

- සංස්කෘතික අයිතිවාසිකම්
- සිවිල් අයිතිවාසිකම්
- දේශපාලන අයිතිවාසිකම්
- ආර්ථික අයිතිවාසිකම්
- සමාජීය අයිතිවාසිකම්

PAST PAPERS WIKI

**මෙම පිළිතුරු අතරින් දෙකක් (2) ලියා තිබීම අවශ්‍ය ය. ළමා අයිතිවාසිකම්, කාන්තා අයිතිවාසිකම්, කම්කරු අයිතිවාසිකම් වැනි පිළිතුරු සඳහා ද ලකුණු ලබා දිය හැකිය.**
**(ලකුණු 02)**

(vi)

- භෞතික ජීවන තත්ව දර්ශකය
- මානව සංවර්ධන දර්ශකය
- මානව දරිද්‍රතා දර්ශකය
- මානව පීඩන දර්ශකය
- බහුමාන දරිද්‍රතා දර්ශකය

- වෙළඳපොළ ව්‍යුහයේ වෙනස්කම
- අන්තර්ගත ධනය පිළිබඳ දර්ශකය
- පරිගණක සාක්ෂරතාව
- හරිත දළ දේශීය නිෂ්පාදිතය
- සතුටු දර්ශකය

ඉහත සඳහන් දර්ශකවලින් ඕනෑම දෙකක් (2) ලියා තිබීම අවශ්‍ය ය.
එක් පිළිතුරකට එක් ලකුණ බැගින් ලකුණු දෙකක් ලබා දෙන්න.
(ලකුණු 02)

(vii)

- දේශපාලන බලය
- පරිපාලන බලය
- සමාජ බලය
- ආර්ථික බලය
- විශේෂඥ බලය
- පාරම්පරික බලය

විවිධ බලයන් අතුරින් මෙවැනි ආකාරයේ උත්තර දෙකක් (2) ලියා ඇත්නම්
ලකුණු දෙකක් ලබා දෙන්න.
(ලකුණු 02)

(viii)

- ජාතික සමගිය හා/සහජීවනය වර්ධනය වේ.
- ගැටුම් අවම වේ.
- අන්‍යෝන්‍ය සුහදත්වය වර්ධනය වේ.
- විශ්වාසය ඇති වේ.
- එක් ජාතියක්, එක් රටක් යන හැඟීම ඇති වේ.
- මිනිස් නිදහස තහවුරු වේ.
- ප්‍රජාතන්ත්‍රවාදය වර්ධනය වේ.
- රටේ සංවර්ධනය වෙනුවෙන් සෑම පුරවැසියෙකු ම කටයුතු කිරීම.
- රටේ සංවර්ධනයට කටයුතු කිරීම ජාතික යුතුකමක් ලෙස සැලකීම.
- අන්‍ය ආගම්වලට අගරු නොවන සේ හැසිරීම.
- අන්‍ය සංස්කෘතීන්ට අගරු නොවන සේ හැසිරීම.

ඉහත දක්වා ඇති කරුණු හෝ ඊට සමාන අදහස දෙන කරුණු දෙකක් (2) ලියා තිබිය හැකිය.
එක් කරුණකට එක් ලකුණක් බැගින් දෙන්න.
(ලකුණු 02)

(ix)

- තොග වෙළඳාම
- සිල්ලර වෙළඳාම

ඉහත වෙළඳාම් වර්ග දෙක ලියා තිබීම අවශ්‍ය ය.
එක් පිළිතුරකට එක් ලකුණක් බැගින් ලබා දෙන්න.
(ලකුණු 02)

(x)

- ආහාර හා කෘෂිකර්ම සංවිධානය (FAO)
- අන්තර්ජාතික කම්කරු සංවිධානය (ILO)
- එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP)
- එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF)
- එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික, විද්‍යාත්මක හා සංස්කෘතික සංවිධානය (UNESCO)
- ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය පිළිබඳ අන්තර්ජාතික බැංකුව/ ලෝක බැංකුව (IBRD)
- අන්තර්ජාතික මූල්‍ය අරමුදල (IMF)
- එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල (UNFPA)
- ලෝක ආහාර වැඩසටහන (WFP)
- ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO)
- සරණාගතයන් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලය (UNHCR)

**ඉහත සඳහන් ආයතන කෙටි නමින් හඳුන්වා තිබුණ ද ලකුණු ලබා දෙන්න.**
**උදා: යුනෙස්කෝ ආදි ලෙස, එක් පිළිතුරකට එක් ලකුණක් බැගින් ලකුණු දෙකක් දෙන්න.**
**(ලකුණු 02)**

**(1 වන ප්‍රශ්නය සඳහා සමස්ත ලකුණු 2 x 10 =20)**

## 2. වන ප්‍රශ්නයේ අපේක්ෂිත ඉගෙනුම් ඵල -

- *අර්ථ ක්‍රමයක භාණ්ඩ නිෂ්පාදනය සඳහා යොදා ගන්නා ශිල්පීය ක්‍රම විස්තර කරයි.*
- *ආර්ථිකයක් තුළ දක්නට ලැබෙන ආර්ථික නොවන භාණ්ඩ වෙන් කර හඳුනා ගනියි.*
- *ආර්ථික ප්‍රශ්න විසඳා ගැනීම සඳහා විවිධ සමාජ සංවිධානය වී ඇති ආකාරය විස්තර කරයි.*
- *සමාජ සංවිධනය වී ඇති ආකාරයන් හි ලක්ෂණ විග්‍රහ කරයි.*

**2.** අර්ථ ක්‍රමයක් යනු මිනිසා මුහුණ දෙන ප්‍රධාන ආර්ථික ප්‍රශ්න විසඳාගැනීම සඳහා විවිධ සමාජ සංවිධානය වී ඇති ආකාරයයි.

(i) භාණ්ඩ නිෂ්පාදනය සඳහා යොදා ගන්නා ප්‍රධාන ශිල්පීය ක්‍රම **දෙක** මොනවා ද? (ලකුණු 02 යි)

(ii) මිනිස් වුවමනා ඉටු කර ගැනීමේ දී භාවිත කරන ආර්ථික නොවන භාණ්ඩ **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(iii) (*a*) මූලික ආර්ථික ප්‍රශ්න විසඳාගැනීම සඳහා විවිධ සමාජ සංවිධානය වී ඇති ආකාර **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(*b*) ඉහත (*a*) හි සඳහන් කරන ලද එක් ආකාරයක මූලික ලක්ෂණයක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 03 යි)

(i)

- ප්‍රාග්ධන සූක්ෂම (යන්ත්‍ර සූත්‍ර යොදා ගැනීම)
- ශ්‍රම සූක්ෂම (ශ්‍රමය යොදා ගැනීම)

**ඉහත ආකාරයට ශිල්පීය ක්‍රම දෙක නම් කර ඇත්නම් එක් පිළිතුරකට**
**ලකුණු එකක් බැගින් ලකුණු දෙකක් දෙන්න.**
**(ලකුණු 02)**

උදාහරණ:- නිවැරදිලිය, වාහන, වැසි ජලය, ශාකාවල ජලය, ජලාශවල ජලය, මුහුදු ජලය,
වනාන්තරවල දව

එක් උදාහරණයකට එක් ලකුණක් බැගින් ලකුණු 3ක් ලබා දෙන්න.
(ලකුණු 03)

(iii)

(a) ආර්ථික ප්‍රශ්න විසඳා ගැනීම සඳහා සමාජ සංවිධානය වී ඇති ආකාර තුනකි.

- ධනවාදී ආර්ථ ක්‍රමය
- සමාජවාදී ආර්ථ ක්‍රමය
- මිශ්‍ර ආර්ථ ක්‍රමය

ධනවාදී, සමාජවාදී ආදී ලෙස පමණක් ලියා තිබුණත් ලකුණු ලබා දෙන්න.
එක් පිළිතුරකට ලකුණක් බැගින් ලකුණු දෙකක් හිමි වේ.
(ලකුණු 02)

(b) ලියා ඇති ආර්ථ ක්‍රම දෙකින් එකක් තෝරාගෙන එහි ලක්ෂණයක් විස්තර කර තිබිය යුතුය. තෝරාගත් ආර්ථ ක්‍රමය කුමක් ද යන්න ද සඳහන් කර තිබීම අවශ්‍ය වේ.
උදා:-

ධනවාදී ආර්ථ ක්‍රමය
- තරගකාරී වෙළඳපොළක් තිබීම
- නිෂ්පාදන සාධක පෞද්ගලික අංශය සතු වීම
- ලාභය අරමුණු කරගෙන ක්‍රියා කිරීම
- අසමාන ලෙස ආදායම් බෙදී යාම

සමාජවාදී ආර්ථ ක්‍රමය
- දේපළ අයිතිය රජය සතු වීම
- මධ්‍ය සැලසුම් මණ්ඩලයක් මගින් ආර්ථිකය මෙහෙය වීම
- පොදු යහපත උදෙසා කටයුතු කිරීම

මිශ්‍ර ආර්ථ ක්‍රමය
- නිෂ්පාදන සාධක රාජ්‍ය හා පෞද්ගලික අංශය සතු වීමු
- වෙළඳපොළ මිල තීරණය වීමේ දී රාජ්‍යය මැදිහත් වීම
- නිෂ්පාදනය රාජ්‍ය හා පෞද්ගලික අංශ මගින් සිදු කිරීම
- පොදු යහපත සඳහා රජය සුභසාධන කටයුතුවලට මැදිහත් වීම

ඉහත පිළිතුරු හෝ ඒ සමාන සුදුසු පිළිතුරු ලියා ඇත්නම් ලකුණු 3ක් දෙන්න.
ආර්ථ ක්‍රමය හා එහි ලක්ෂණය නම් කිරීම ලකුණු 01
සුදුසු පරිදි විස්තර කර තිබීම ලකුණු 02
(ලකුණු 03)

(2 වන ප්‍රශ්නය සඳහා සමස්ත ලකුණු 10)

## 3. වන ප්‍රශ්නයෙන් අපේක්ෂිත ඉගෙනුම් ඵල -

- පුද්ගලයන් අතර ඇති වන වැරදි වැටහීම් නිසා ඇතිවිය හැකි මානසික තත්ත්වයන් පැහැදිලි කරයි.
- ගැටුම් නිරාකරණය කර ගැනීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග විශ්ලේෂණය කරයි.
- සමථකරණය මගින් විසඳාගත හැකි ගැටුම් වර්ගවලට නිදසුන් ඉදිරිපත් කරයි.
- සමථකරණය මගින් ගැටුම් නිරාකරණය කර ගැනීමේ වාසි විග්‍රහ කරයි.

**3.** ගැටුම්කාරී චර්යාවන් සහිත පුද්ගලයන් නිසා පවුල තුළ මෙන්ම සමාජය තුළ ද ගැටුම්කාරී තත්ත්ව නිර්මාණය වීම සිදු වේ.

(i) පුද්ගලයන් අතර ඇතිවන වැරදි වටහාගැනීම්වල ප්‍රතිඵලයක් ලෙස ඇති විය හැකි මානසික තත්ත්ව **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ii) ගැටුමක් ඇති වීමට බලපාන මූලික හේතු **තුන** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) (*a*) සමථකරණය මගින් විසඳාගත හැකි ගැටුම් සඳහා උදාහරණ **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(*b*) සමථකරණය මගින් ගැටුම් නිරාකරණය කර ගැනීමෙන් පුද්ගලයකුට ලැබිය හැකි වාසියක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 03 යි)

**(i)**

- පුද්ගලයන් තුළ ඇතිවන මානසික තත්ත්වයන් නම් කර තිබීම අවශ්‍ය ය.
- උදා:- බිය, සැකය, අවිශ්වාසය, කෝපය, වෛරය, අපේක්ෂා භංගත්වය, ආතතිය, නොරිස්සුම්බව, කනස්සල්ල, අසහනය

**මෙවැනි කරුණු ලියා ඇත්නම් එක් කරුණකට එක් ලකුණක් බැගින් ලකුණු දෙකක් දෙන්න.**

**(ලකුණු 02)**

**(ii)**

- ආකල්ප
- චර්යාව
- සන්දර්භය
- විවිධ ප්‍රතිරූප
- වෙනත් අදහස්
- සීමා ඇති වීම
- අවහිරතා ඇති වීම
- මානසික තත්ත්ව
- පරමාර්ථ ඉටු නොවීම

**ගැල්වුම් සඳහන් කර ඇති හේතු තුන ලියා තිබීම අපේක්ෂා කෙරේ. නමුත් ගැටුමට හේතු ලෙස දක්වා ඇති කරුණු 3ක් ලියා තිබුණ ද අදාළ ලකුණු ලබා දෙන්න.**

**(ලකුණු 03)**

**(iii)**

**(a)** සමථකරණය මගින් විසඳා ගත හැකි ගැටුම් සඳහා උදාහරණ,

- පවුල් ආරවුල්
- කම්කරු ආරවුල්
- පුද්ගල කණ්ඩායම් අතර පවතින ආරවුල්
- පොදු දේපළ සම්බන්ධ ආරවුල්
- නින්දා කිරීම්
- දේපළ සම්බන්ධ වැරදි (දේපළවලට හානි කිරීම)
- වැටවල්, සීමා සම්බන්ධ ගැටලු
- සුළු ණය මුදල් නොගෙවීම
- පාසල් ආශ්‍රිත ගැටුම්

**ඉහත සඳහන් ආකාරයේ කරුණු හෝ සමථකරණයට යොමු වන වෙනත් වැරදි සඳහා ද ලකුණු ලබා දිය හැකිය. එක් කරුණකට එක් ලකුණක් බැගින් ලකුණු දෙකක් ලබා දෙන්න.**

**(ලකුණු 02)**

(b) සමථකරණය මගින් ගැටලු විසඳා ගැනීම මගින් පුද්ගලයෙකුට ඇතිවන වාසියක් සඳහන් කර, එය විස්තර කර තිබීම අවශ්‍ය ය.

- පුද්ගලයන්ට ඉක්මනින් විසඳුමක් ලබා ගත හැකි වීම.
- වැයවන කාලය අවම වීම
- නීතිඥයන්ට මුදල් ගෙවීමට අවශ්‍ය නොවීම
- සාධාරණ විසඳුමකට එකඟතාවක් ඇති වීම
- සුහදත්වය ගොඩනගා ගත හැකි වීම
- යුක්තිය පිළිබඳ විශ්වාසයක් ඇති වීම
- අනවශ්‍ය කරදරවලින් තොර වීම

**මෙවැනි ආකාරයේ සමථකරණය නිසා ඇතිවිය හැකි වාසියක් විස්තර කර තිබීම ලකුණු දිය හැකිය.**

**වාසිය නම් කර ඇත්නම් ලකුණු 01යි.**

**අදාළ වාසිය විස්තර කිරීම ලකුණු 02යි.**

**(ලකුණු 03)**

**(3 වන ප්‍රශ්නය සඳහා සමස්ත ලකුණු 10)**

**4. වන ප්‍රශ්නයෙන් අපේක්ෂිත ඉගෙනුම් ඵල -**

- *ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතියේ පිහිටුවා ඇති අධිකරණ ආයතන විග්‍රහ කරයි.*
- *මහාධිකරණය විසින් විසඳනු ලබන බරපතල අපරාධ විස්තර කරයි.*
- *අධිකරණය මගින් යුක්තිය ඉටු වීම ප්‍රමාදවීමෙන් ඇති වන අවාසි විමර්ශනය කරයි.*
- *යුක්තිය ඉටු නොවීමෙන් ඇතිවන අවාසි වළක්වා ගත හැකි ක්‍රම සාකච්ඡා කරයි.*

**4.** රාජ්‍යයක වගකීම වන්නේ රට තුළ නීතිය හා සාමය පවත්වා ගනිමින් යහපත් සමාජයක් ගොඩනංවා ගැනීම ය.

(i) ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතියේ දක්නට ලැබෙන ඉහළ ම අධිකරණ ආයතන **දෙක** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) මහාධිකරණය මගින් විසඳනු ලබන බරපතල අපරාධ ලෙස සැලකෙන වැරදි **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) (*a*) අධිකරණය මගින් යුක්තිය ඉටුකර ගැනීමට විශාල කාලයක්, ශ්‍රමයක් හා මුදලක් වැය කිරීමට සිදු වන නිසා ඇති විය හැකි **අහිතකර** ප්‍රතිඵල **දෙකක්** දක්වන්න. (ලකුණු 02 යි)

(*b*) ඉහත (*a*) හි සඳහන් කරන ලද අහිතකර ප්‍රතිඵල වළක්වා ගැනීමට පුරවැසියාට ගත හැකි ක්‍රියාමාර්ගයක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 03 යි)

**(i)** ඉහළම අධිකරණ ආයතන දෙක නම් කිරීම අවශ්‍ය ය. අනුපිළිවෙලට ලියා තිබීම අවශ්‍ය නොවේ.

- ශ්‍රේෂ්ඨාධිකරණය
- අභියාචනාධිකරණය

**එක් පිළිතුරකට එක් ලකුණ බැගින් ලකුණු දෙකක් (02) දෙන්න.**

**(ලකුණු 02)**

**(ii)** මහාධිකරණයට බරපතළ අපරාධ සම්බන්ධ නඩු ...
ඒවා නම්,

- මිනීමැරුම්
- මිනීමැරීමට තැත් කිරීම
- ස්ත්‍රී දූෂණ
- රාජ්‍ය විරෝධී කුමන්ත්‍රණ
- විශාල මංකොල්ලකෑම්
- ලිංගික අපරාධ
- මත්ද්‍රව්‍ය සම්බන්ධ නඩු
- පොදු දේපළවලට හානි කිරීම

**මෙම අපරාධ අතුරින් තුනක් ලියා තිබේ නම් ලකුණු ලබා දෙන්න.**
**වෙනත් පිළිතුරු සඳහා ලකුණු හිමි නොවේ.**
**(ලකුණු 03)**

**(iii)**
**(i)** අධිකරණය මගින් යුක්තිය ඉටුකර ගැනීමට විශාල කාලයක්, ශ්‍රමයක් හා මුදලක් වැය වීම නිසා ඇති විය හැකි අහිතකර ප්‍රතිඵල නම්,

- අධිකරණය පිළිබඳ විශ්වාසය නැති වීම
- නීතියේ සාධාරණත්වය පිළිබඳ අවිශ්වාසය
- අවනීතිය (කැලෑනීතිය) ක්‍රියාත්මක වීම
- අපරාධ හා දූෂණ වර්ධනය වීම
- නීතියේ සමානාත්මතාව හා සාධාරණත්වය ඉටු නො වීම
- මත්ද්‍රව්‍ය වෙළඳාම ව්‍යාප්ත වීම
- පුද්ගලයන් පොලීසියට ගරු නොකිරීම
- නීතිවිරෝධී මිනීමැරුම් සිදු වීම
- අනවසර ඉදිකිරීම් ආදිය සිදු වීම
- දේශපාලන බලපෑම් ඇති වීම

**ඉහත සඳහන් ආකාරයේ අහිතකර ප්‍රතිඵල දෙකක් සඳහන් කර තිබීම අවශ්‍ය ය.**
**මෙවැනි සමාන ආකාරයේ පිළිතුරු ද ලකුණු දීමේ දී සැලකිල්ලට ගන්න.**
**එක් කරුණකට එක් ලකුණක් බැගින් ලකුණු දෙකක් දෙන්න.**
**(ලකුණු 02)**

**(ii)** ඉහත (iii) (a) සඳහා ඉදිරිපත් කරන ලද අහිතකර ප්‍රතිඵලය වළක්වා ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ගයක් නම් කර, විස්තර කර තිබීම අපේක්ෂා කෙරේ. ශිෂ්‍යයන්ට නිදහසේ පිළිතුරු දිය හැකිය.

- නීතිය පිළිබඳ දැනුවත්භාවය ලබා ගැනීම
- ඉවසීමෙන් ප්‍රතිඵලය ලැබෙන තුරු බලා සිටීම
- නීතිය කඩ කරන අය පිළිබඳ පොලිසිය දැනුවත් කිරීම
- නීතිය සාධාරණය පවත්වා ගැනීමට උදව් කිරීම

**මෙවැනි ක්‍රියාමාර්ග සඳහන් කර තිබිය හැකිය. සුදුසු පිළිතුරු සඳහා ලකුණු ලබා දෙන්න.**
**ක්‍රියා මාර්ගය නම් කර තිබීම ලකුණු 01යි.**
**එම ක්‍රියා මාර්ගය විස්තර කිරීම ලකුණු 02යි.**
**(ලකුණු 03)**

**(4 වන ප්‍රශ්නය සඳහා සමස්ත ලකුණු 10)**

5. වන ප්‍රශ්නයෙන් අපේක්ෂිත ඉගෙනුම් ඵල -

- රාජ්‍යයක දක්නට ලැබෙන මූලික ලක්ෂණ නම් කරයි.
- රාජ්‍යයකට ඉටු කිරීමට පැවරෙන කාර්යයන් විමසා බලයි.
- රාජ්‍යයක පුරවැසියා කෙරෙහි වන වගකීම් විස්තර කරයි.
- රාජ්‍යයක පුරවැසියා කෙරෙහි වන වගකීම් නිසා ඇති වන වාසි පැහැදිලි කරයි.

5. "මිනිසුන්ට එකට එක් වී ප්‍රීතිමත් හා ගෞරවාන්විත ජීවිතයක් ගත කිරීමේ අරමුණින් පිහිටුවා ගත් සංවිධානය රාජ්‍යය ලෙස හැඳින්වේ."

(i) රාජ්‍යයක දක්නට ලැබෙන මූලික ලක්ෂණ **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ii) රාජ්‍යයකට ඉටු කිරීමට පැවරෙන කාර්ය **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) (*a*) රාජ්‍යයක පුරවැසියා කෙරෙහි වන වගකීම් **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(*b*) ඉහත (*a*) හි සඳහන් කරන ලද වගකීම් නිසා පුරවැසියකුට අත්වන වාසියක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 03 යි)

**(i)** රාජ්‍යයක ප්‍රධාන ලක්ෂණ හතරක් දක්නට ලැබේ.

- භූමිය
- ජනගහනය
- ආණ්ඩුව
- ස්වාධිපති බලය

**ඉහත ලක්ෂණවලින් දෙකක් ලියා ඇත්නම් ලකුණු දෙකක් දෙන්න.**
**(ලකුණු 02)**

**(ii)** රාජ්‍යයකට ඉටු කිරීමට පැවරෙන කාර්යයන් පහත දැක්වේ.

- නීතිය හා සාමය ආරක්ෂා කිරීම
- ආර්ථික ස්ථාවරත්වය පවත්වා ගැනීම
- දේශපාලන ස්ථාවරත්වය පවත්වා ගැනීම
- සමාජ සුභසාධක සේවා සැපයීම
- දිළිඳුකම තුරන් කිරීමට කටයුතු කිරීම
- පොදු සේවා පවත්වා ගෙන යාම
- සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීම
- යුද, කැරලි කෝලාහල, වාර්ගික අර්බුද වැනි ගැටුම් විසඳීම (වෙන් වෙන්ව ලියා ඇත්නම් නිවැරදි පිළිතුරු ලෙස සලකන්න)
- මූලික මිනිස් අයිතිවාසිකම් ආරක්ෂා කිරීම

**ඉහත දක්වා ඇති කාර්යයන් අතුරින් තුනක් ලියා තිබීම අවශ්‍ය ය.**
**එක් පිළිතුරකට එක් ලකුණක් බැගින් ලකුණු තුනක් දෙන්න.**
**(ලකුණු 03)**

1811 – 17
1813 – 11

(4) – 1813 – 28
1838 – 24
1817 – 01
(3)
(25)

(iii)

(a) රාජ්‍යයකට පුරවැසියා කෙරෙහි වන වගකීම් පහත දැක්වේ.

- නීතිය හා සාමය ආරක්ෂා කිරීම
- සමානාත්මතා මූලධර්මය ආරක්ෂා කිරීම
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව කටයුතු කිරීම
- නීතියේ සාධාරණත්වය සුරක්ෂිත කිරීමට ඉඩ සැලසීම
- රටේ සම්පත් සාධාරණව බෙදී යන පරිදි කටයුතු කිරීම
- රාජ්‍ය මුදල් විනිවිදභාවයෙන් යුතුව පාලනය කිරීම
- සමාජ සුරක්ෂිතභාවය ඇති කිරීම
- සමාජ සුභසාධනය සැලසීම
- පරිසරය ආරක්ෂා කොට සුරක්ෂිත කිරීම

ඉහත දැක්වෙන කරුණු අතරින් දෙකක් ලියා තිබිය යුතුය.
මෙම අදහසට සමාන වන සේ ලියා ඇති පිළිතුරු ද ලකුණු දීමේ දී සැලකිල්ලට ගන්න.
එක් කරුණකට එක ලකුණ බැගින් ලකුණු දෙකක් දෙන්න.
(ලකුණු 02)

(b) මෙය ශිෂ්‍යයාට නිදහසේ පිළිතුරු දිය හැකි නිර්මාණාත්මක ප්‍රශ්නයකි. ඉහත වගකීමක් ඉටු කිරීම නිසා පුරවැසියාට වන වාසි සඳහන් කර තිබිය යුතුය. එවැනි වාසි කිහිපයක් පහත දැක්වේ.

- රටේ සාමය ආරක්ෂා වීම නිසා බියෙන් සැකෙන් තොරව ජීවත් වීමට හැකි වීම
- සෑම දෙනාට ම සමාන ආකාරයට වාසි හා ප්‍රතිලාභ හිමි වීම
- දුප්පත් පුද්ගලයන්ට ඉන් මිදීමට සුභසාධනයක් ඉටු වීම
- රටේ අල්ලස් දූෂණය වැනි ක්‍රියාදාමයන් අඩු වීම
- මුදල් අවභාවිතයෙන් වැළකීම

මෙවැනි ආකාරයේ පිළිතුරක් ලබා දී ඇති නම් ලකුණු ලබා දෙන්න.
වාසිය නම් කිරීමට ලකුණු 01යි
එය විස්තර කිරීමට ලකුණු 02යි
(ලකුණු 03)

(5 වන ප්‍රශ්නය සඳහා සමස්ත ලකුණු 10)

Past Papers Wiki

සංසිද්ධීන් ඇසුරින් භෞතික පරිසරයට සිදු වන හානි පිළිබඳව විග්‍රහ කරයි.

- මිනිස් ක්‍රියාකාරකම් නිසා පරිසරයේ වායු දූෂණය ඇති වන අවස්ථා විස්තර කරයි.
- මිනිස් ක්‍රියාකාරකම් නිසා පරිසරයට ඇති වන හානි වළක්වා ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග විස්තර කරයි.

**6.** පුද්ගලයන් ජීවත්වන වටපිටාව, සියලු ජීවීන්, ඔවුන් අතර පවතින අන්තර් සම්බන්ධතාව හා එහි පැවැත්මට දායක වන ක්‍රියාකාරකම් පරිසරය ලෙස හැඳින්විය හැකි ය.

(i) ස්වාභාවික පරිසරයට අයත් ප්‍රපංච සඳහා උදාහරණ **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ii) ස්වාභාවික සංසිද්ධීන් ඇසුරින් භෞතික පරිසරයට සිදුවන හානි **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(iii) (*a*) මිනිස් ක්‍රියාකාරකම් නිසා වායු දූෂණය සිදු වන අවස්ථා **දෙකක්** දක්වන්න. (ලකුණු 02 යි)

(*b*) මිනිස් ක්‍රියාකාරකම් නිසා පරිසරයට සිදුවන හානි වළක්වා ගැනීමට පුරවැසියකු ලෙස ඔබට ගත හැකි ක්‍රියාමාර්ගයක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 03 යි)

**(i)** ස්වභාවික පරිසරයට අයත් ප්‍රපංච සඳහා උදාහරණ පහත දැක්වේ.

- වනාන්තර
- කඳුපන්ති
- සත්ත්වයන්/ සතුන්/ ජීවීන්
- ශාකවර්ග/ ගහකොළ
- කුරුල්ලන්
- ගංගා/ ජලය
- හිරුඑළිය
- පාංශු/ පස්/ පාෂාණ
- වාතය

**ඉහත ප්‍රපංච සඳහා උදාහරණ දෙකක් සඳහන් කර තිබීම අවශ්‍ය ය. එක පෙළට සඳහන් කර ඇති පිළිතුරු එක පිළිතුරක් ලෙස සලකන්න. එක් පිළිතුරකට එක් ලකුණ බැගින් ලකුණු දෙකක් දෙන්න.**

**(ලකුණු 02)**

**(ii)** ස්වභාවික සංසිද්ධීන් ඇසුරින් භෞතික පරිසරයට සිදුවන හානි නම්,

- භූමිකම්පා
- නායයෑම්
- ගිනිකඳු පිපිරීම
- ලැව්ගිනි
- හිම කඳු කඩා වැටීම
- ජල ගැලීම්
- නියඟ
- සුළි කුණාටු
- සුනාමි

**ඉහත දක්වා ඇති හානි අතුරින් තුනක් ලියා තිබීම අවශ්‍ය ය. එක් හානියක් සඳහා එක් ලකුණක් බැගින් ලකුණු තුනක් දෙන්න.**

**(ලකුණු 03)**

PAST PAPERS WIKI

(iii)

(a) මිනිස් ක්‍රියාකාරකම් නිසා වායු දූෂණය වන අවස්ථා නම්,

- කර්මාන්ත ශාලා මඟින් පිටවන දුම්
- වාහනවලින් දුම් පිට කිරීම
- කැළිකසල අක්‍රමවත්ව බැහැර කිරීම
- පොලිතීන් වැනි දේ පිළිස්සීම
- ගුවන් යානා භාවිතය
- වනාන්තර ගිනි තැබීම
- න්‍යෂ්ටික අත්හදා බැලීම්

**මෙවැනි ආකාරයට වායු දූෂණය වන අවස්ථා දෙකක් නම් කර තිබීම අවශ්‍ය ය.**
**එක් අවස්ථාවකට එක් ලකුණ බැගින් ලකුණු දෙකක් දෙන්න.**
(ලකුණු 02)

(b) පරිසරයට වන හානි වළක්වා ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග රාශියකි.

- පරිසරය පිළිබඳ සමාජය දැනුවත් කිරීම
- අධික වාහන දුම් පිටකරන වාහන ධාවනය නොකිරීම
- කැළිකසල ක්‍රමවත් ව ප්‍රතිචක්‍රීකරණය කිරීම
- පොලිතීන් භාවිතය අවම කිරීම
- පරිසරයට හානි කරන අය නීතියට හසුකර දීම
- කර්මාන්තශාලාවලින් වායු පිට වීම පාලනය කිරීම
- සම්පත් අධි භාවිතයෙන් වැළකීම
- පරිසරයට ආදරය කිරීම

මෙය විවෘත ප්‍රශ්නයකි. ශිෂ්‍යයන්ට නිර්මාණශීලී ව පිළිතුරු දිය හැකිය.
මෙවැනි ආකාරයට ශිෂ්‍යයාට කැමති පිළිතුරක් ලබා දිය හැකිය.
ක්‍රියාමාර්ගය නම් කිරීමට ලකුණු 01යි
විස්තර කිරීමට ලකුණු 02යි
(ලකුණු 03)

(6 වන ප්‍රශ්නය සඳහා සමස්ත ලකුණු 10)

Past Papers Wiki



7. වන ප්‍රශ්නයෙන් අපේක්ෂිත ඉගෙනුම් ඵල -

- රටක පුද්ගලයන්ට හිමිවන ආර්ථික සමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම් විස්තර කරයි.
- ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ දී අවධානය යොමු කරන ලද කරුණු පැහැදිලි කරයි.
- ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ සුභසාධනය සඳහා ශ්‍රී ලංකාව ගෙන ඇති ක්‍රියාමාර්ග විස්තර කරයි.
- පවුලේ වැඩිහිටියන් සතුටින් තැබීම සඳහා පවුලේ සාමාජිකයන්ට ගත හැකි ක්‍රියාමාර්ග විමර්ශනය කරයි.

7. ජාතිය, ජන වර්ගය, ආගම, භාෂාව, ස්ත්‍රී-පුරුෂ භාවය, සමාජ පන්තිය හා දේශපාලන මතය ආදී විෂමතා කිසිවක් නොසලකා පොදුවේ සැමට අයිතිවාසිකම් හිමි විය යුතු වේ.
   (i) ආර්ථික, සමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම් **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)
   (ii) ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය සකස් කිරීමේ දී අවධානය යොමු කරන ලද සුවිශේෂී අරමුණු **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)
   (iii) (*a*) ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ සුභසාධනය සඳහා රජය ගෙන ඇති ක්‍රියාමාර්ග **දෙකක්** දක්වන්න. (ලකුණු 02 යි)
   (*b*) ඔබගේ පවුලේ වැඩිහිටියන් සතුටෙන් තැබීම සඳහා ඔබට ගත හැකි ක්‍රියාමාර්ගයක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 03 යි)

(i) ආර්ථික, සමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම් පහත දැක්වේ.

- අධ්‍යාපනය ලැබීමට ඇති අයිතිය
- වැඩ කිරීමට ඇති අයිතිය
- සමාන වැඩ සඳහා සමාන වැටුප් ලැබීමට ඇති අයිතිය
- වෘත්තීය සමිති පිහිටුවා ගැනීම හා සම්බන්ධ වීම
- නිවාඩු ලබා ගැනීමේ අයිතිය
- විවේක ගැනීමේ අයිතිය
- ආහාර, ඇඳුම්, නිවාස හා සෞඛ්‍ය පහසුකම් ලබා ගැනීමේ අයිතිය
- සංස්කෘතික, විද්‍යාත්මක, කලා කටයුතුවලට සහභාගිවීමට ඇති අයිතිය
- සමාජ ආරක්ෂණයට ඇති අයිතිය
- පෞද්ගලික දේපළ ඇරීමට ඇති අයිතිය
- ප්‍රමාණවත් ජීවන තත්ත්වයක් භුක්ති විඳීමට ඇති අයිතිය

**ඉහත දක්වා ඇති අයිතිවාසිකම් අතුරින් දෙකක් ලියා තිබිය යුතුය.**
**එක් කරුණකට එක් ලකුණ බැගින් ලකුණු දෙකක් ලබා දෙන්න.**
(ලකුණු 02)

(ii) ළමා අයිතිවාසිකම් සම්මුතිය සකස් කිරීමේ දී සුවිශේෂී අවධානය යොමු කරන ලද කරුණු නම්,

- පැවැත්ම
- ආරක්ෂාව
- සංවර්ධනය
- සහභාගිත්වය

**ඉහත කරුණු අතුරින් තුනක් සඳහන් කර ඇත්නම් ලකුණු ලබා දෙන්න.**
**එක් කරුණකට එක් ලකුණු බැගින් ලකුණු තුනකි.**
(ලකුණු 03)

PAST PAPERS WIKI

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

(iii)

(a) ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ සුභසාධනය සඳහා රජය ගෙන ඇති ක්‍රියාමාර්ග,

- රජයේ සේවය කළ අයට විශ්‍රාම වැටුපක් ලබා දීම
- ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා මාසික දීමනාවක් ලබා දීම
- වැඩිහිටියන් සඳහා අධ්‍යාපන අවස්ථා ලබා දීම
- ඖෂධ ලබා ගැනීමේ දී යම් වට්ටමක් ලබා දීම
- රජයේ ආයතනවල සේවය ලබා ගැනීමේ දී ප්‍රමුඛතාව ලබා දීම
- ඉතුරුම් සඳහා විශේෂ පොලියක් ලබා දීම
- වැඩිහිටි හැඳුනුම්පතක් නිකුත් කිරීම
- ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට විශේෂ තැන්පතු ක්‍රමයක් හඳුන්වා දීම

වැනි කරුණු පිළිතුරු ලෙස ලියා තිබිය හැකිය. මීට අමතරව අදාළ පිළිතුරු ලියා ඇත්නම් ඒවා කෙරෙහි අවධානය යොමු කරන්න. එක් කරුණකට එක් ලකුණ බැගින් ලකුණු දෙකක් දෙන්න.

(ලකුණු 02)

(b) මෙයට ද ශිෂ්‍යයාට නිර්මාණශීලීව පිළිතුරු දිය හැකිය. පවුලේ වැඩිහිටියන් සතුටින් තැබිය හැකි ක්‍රමයක් විස්තර කර තිබීම අවශ්‍ය ය.

- විනෝද චාරිකා රැගෙන යාම
- ආගමික වැඩසටහන් සංවිධානය කිරීම
- සුහද හමු සංවිධානය කිරීම
- විශේෂ ආහාර පාන ලබා දීම
- වැඩිහිටියන්ගේ අවවාද පිළිපැදීම
- වැඩිහිටියන්ට නමස්කාර කිරීම
- වැඩිහිටියන්ට ගෞරව කිරීම
- ත්‍යාග ලබා දීම
- උපන්දින සැමරීම

මෙවැනි ක්‍රියාමාර්ගයක් නම් කිරීමට ලකුණු 01යි

විස්තර කිරීමට ලකුණු 02යි

(ලකුණු 03)

(7 වන ප්‍රශ්නය සඳහා සමස්ත ලකුණු 10)

***

| | | | | |
|---|---|---|---|---|
| 20 | 0-5 | 6-10 | 11-15 | 16-20 |
| 10 | 0-2 | 3-5 | 6-7 | 8-10 |

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi
Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library